# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 42/18 — 1973 ජනවාරි 15 වැනි සඳුද — 1973.01.15

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

ජනා. කා. අංක: ඩබ්ලිව්. 68 (22) /73.

**මහාජන ආරක්ෂක ආඥාපනත (40 වැනි අධිකාරය)**

අගමැතිගේ නිර්දේශය අනුව (40 වැනි අධිකාරය වන) මහාජන ආරක්ෂක ආඥාපනතේ 5 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලැබූ නියෝගය.

වි. ගොපල්ලව,
ජනාධිපතිවරයා.

1973 ජනවාරි 15 වැනි දින,
කොළඹ, ජනාධිපති කාර්යාලයේ දී ය.

**නියෝගය**

වෙන යම් ලිඛිත නීතියක කුමක් සඳහන්ව ඇත ද එය නොතකා, මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් එක් එක් පළාත් පාලන ආයතනයේ දනට නිලයෙහි සිටින සභිකයන්ගේ නිල කාලය මේ නියෝගය බල රහිත වන දිනය දක්වා මෙයින් දීර්ඝ කරනු ලැබේ.

**උපලේඛනය**

කෑගල්ල නගර සභාව
කැළණිය සුළු නගර සභාව
රත්කොට සුළු නගර සභාව
මුත්තූර් සුළු නගර සභාව
කල්පිටිය සුළු නගර සභාව
පැල්මඩුල්ල සුළු නගර සභාව
තලවකැලේ-ලිඳුල නගර සභාව


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

26/51——කේ 18870—2,500 (72/12)